# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් හා පළපුරුද්දලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## තනතුර - ආර්ථික පර්යේෂණ නිලධාරි

**තනතුරු සංඛ්‍යාව - 01**

**සේවා ගණය** : කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-2)

**වැටුප් ක්‍රමය** : රු. 43,355/=, 10x755/=, 18x1,135/= රු. 71,355/= (JM 1-2 2016) (මාසික) + රජයේ අනුමත දීමනා

(කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 02/2016 හි 11 උපලේඛනය අනුව වැටුප් ගෙවනු ලැබේ)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආර්ථික විද්‍යාව, වාණිජවේදී/ ව්‍යාපාර පරිපාලනය උපාධියක් ලබා තිබීම (සංඛ්‍යානය විෂයක් වශයෙන් හදාරා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ) **හෝ**

ii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (අදාළ ක්ෂේත්‍රයේ තනතුරක පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ) **හෝ**

iii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමග**

ඉහත සුදුසුකම ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 කට නොඅඩු පළපුරුද්දක් ලබාතිබීම. **හෝ**

iv. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමග**

ඉහත සුදුසුකම ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයකට (10)කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. **හෝ**

v. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවෙකු වීම **හෝ**

vi. පොල් සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික/ තාක්ෂණික නොවන) සේවා ගණයන්හි 11 ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා.
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල අනතුරු රක්ෂණාවරණය
3. සේවක අර්ථසාධක අරමුදල : සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරන ලද තනතුර, සේවය කරන ලද කාල සීමාව, සමග අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබාගත හැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුවන්ගේ සම්පූර්ණ විස්තර සහිතව පිළියෙළ කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2016.12.15 දින හෝ ඊට පෙර එවිය යුතුය. (අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.)

රජයේ දෙපාර්තමේන්තු / පළාත් රාජ්‍ය සේවය/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානී මගින් ද පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අංශ ප්‍රධානීන් මගින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතිකපත් නොමැති හා දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මගින් යොමු කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙහි ද පළ කර ඇත. www.cda.lk

**සභාපති,**
**පොල් සංවර්ධන අධිකාරිය,**
**අංක 11. ආදිපාද වීදිය,**
**කොළඹ 01.**